www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව: 'ත්‍රස්තවාදී කුමන්ත්‍රනයට' මිලිටරි රහස් ඔත්තු අංශය සම්බන්ධ ය

**Sri Lanka: military intelligence involved in "terrorist conspiracy"**

ඩබ්ලිව්.ඒ. සුනිල් සහ කේ. රත්නායක විසිනි
2007 අප්‍රේල් 30

තමන් ප්‍රධාන ගනයේ ත්‍රස්තවාදී කුමන්ත්‍රනයක් කුඩු කර දැමූ බවට පෙබරවාරි මස පැවති ප්‍රවෘත්ති සාකච්ඡාවක දී ශ්‍රී ලංකා මිලිටරිය පාරම් බෑවේ ය. පැය 48කටත් වඩා අඩු කාලයකට පූර්වයෙන් අත් අඩංගුවට ගෙන රඳවා ගන්නා ලද පුද්ගලයන් තිදෙනෙකුගෙන් ලබා ගත් පාපොච්චාරන අඩංගු විඩියෝ පටයක් නිලධාරීහු එහි දී ප්‍රදර්ශනය කලහ. තමන් කලින් ප්‍රසිද්ධියට පත්ව නොතිබූ විප්ලවකාරී විමුක්ති ව්‍යාපාරය (ආර්එල්ම්) නම් කන්ඩායමක සාමාජිකයන් බවත් දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයෙන් පුහුනුව සහ ආයුධ ලබා ගත් බවත් දිවයිනේ දකුනු ප්‍රදේශයෙහි ත්‍රස්තවාදී ක්‍රියාවන් සිදු කිරීම සඳහා කුමන්ත්‍රනය කල බවත් එම පුද්ගලයන් තිදෙනා විසින් පිලිගන්නා ආකාරය ඉන් විදහා දැක්වුනි.

රඳවා ගැනීම, අතුරුදන් කිරීම සහ සිය ගනන් ජනයා ඝාතනය කිරීම ඇතුලු පසු ගිය වසර පුරා සිදු කල ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් උල්ලංඝනය කිරීමේ ක්‍රියාවන් සම්බන්ධයෙන් දේශීයව සහ ජාත්‍යන්තරව එල්ල වූ තියුනු පීඩනයකට මුහුන දී සිටි මිලිටරියට මෙම තැති ගන්වන සුලු ප්‍රකාශ මහත් සුවපහසුවක් ගෙන දෙන්නක් විය. යලි ආරම්භ කල රටේ සිවිල් යුද්ධයේ විරුද්ධවාදීන් "සිංහල කොටි" - එනම්, ද්‍රෝහීන් - බවත් "ජාතික ආරක්ෂාවට" තර්ජනය කරන්නන් බවත් සනාථ කරන සාක්ෂ්‍යයක් ලෙස ආන්ඩුව හා ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) සහ ජාතික හෙල උරුමය (ජාහෙඋ) යන සිංහල ස්වෝත්තමවාදී පක්ෂ සැනෙකින් මෙම "පාපොච්චාරන" ඩැහැ ගත්තේ ය.

අත් අඩංගුවට ගත් පුද්ගලයන් තිදෙනා, එනම් පරිගනක අක්ෂර සංයෝජකයෙකු වන නිහාල් සේරසිංහ, සැලසුම් ශිල්පියෙකු වන ලලිත් සෙනෙවිරත්න සහ දුම්රිය කම්කරුවෙකු වන සිසිර ප්‍රියංකර යන තිදෙනා ම දශකයකට පමන පෙර ගොඩ නගන ලද වෘත්තීය සමිතියක් වූ දුම්රිය කම්කරු එකතුවේ (ආර්ඩබ්ලිව්සී) ද්විමාසික ප්‍රකාශනය වන අකුන පුවත්පතට සම්බන්ධ ය. ආර්එල්ම්වේ සාමාජිකයන් සහ එල්ටීටීඊයේ සහකරුවන් ලෙස මධ්‍යම කඳුකරයේ වතුකරයෙහි දිස්ත්‍රික්කවල වෙසෙන තවත් 30 දෙනෙකු වට ලා අල්ලා ගැනීමට ඔවුන්ගේ පාපොච්චාරන යොදා ගැනුනි. රට තුල ක්‍රියාත්මකව පවතින අති දරුනු ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ, කිසිදු චෝදනාවක් ඉදිරිපත් කිරීමකින් තොරව ඔවුහු සියලු දෙනා රඳවා ගෙන සිටිති.

පසු ගිය මාසයේ නිකුත් කල ප්‍රකාශයක දී සමාජවාදී සමානතා පක්ෂය (සසප) මෙම සිද්ධියේ සැක සහිත ස්වභාවය ඉස්මතු කර දැක්වී ය. රඳවා ගෙන සිටින බොහෝ "එල්ටීටීඊ සැකකරුවන්" අතරින් කිසිවෙකු ගැන හෝ තොරතුරු හෙලිදරව් කෙරුනු පලමු අවස්ථාව මෙම පුවත්පත් සාකච්ඡාව යයි ද එය සඳහන් කලේ ය. පුද්ගලයන් තිදෙනා රඳවා ගෙන සිටින්නේ පිටස්තර කිසිවකු සමග කිසිදු අදහස් හුවමාරුවක් සිදු කල නොහැකි කොන්දේසි යටතේ බවත් එබැවින් සිය පිලිගැනීම් සිදු කලේ කවර තත්ත්වයන් යටතේ ද යන්න පැහැදිලි කිරීමෙන් ඔවුන් වලක්වා ලූ බව ප්‍රකාශය පෙන්වා දුන්නේ ය.

වඩාත් සිත් කා වදිනසුලු ලක්ෂනය වන්නේ ඔවුන් වෙතින් පාපොච්චාරන මිරිකා ගත් ඉක්මන් භාවය යි. "මේ ගැන කල හැකි පැහැදිලි කිරීම් ඇත්තේ තුනක් පමනි: රැඳවියන් වධ බන්ධනයන්ට ලක් කිරීම මගින් පාපොච්චාරන ලබා ගෙන ඇත, නැතහොත් ඒවා ප්‍රකෝපකාරී ඒජන්තයන්ගේ පාපොච්චාරන ය, නැති නම් ඉහත දෙවර්ගයේ ම සංයෝජනයකි. ශ්‍රී ලංකාවේ දිග්ගැසුනු සිවිල් යුද්ධය තුල දී, මිලිටරි ඔත්තු සේවා හා විවිධ පොලිස් ඒජන්සි මෙම සියලුම විධි ක්‍රම මැනවින් ප්‍රගුන කර ඇත." යැයි සසපය ප්‍රකාශ කලේ ය.

මිලිටරි රහස් ඔත්තු අංශය අඩු ගනනේ තමන්ගේ එක් ඒජන්තයෙකු වත් එම කන්ඩායම තුලට ඇතුලු කොට සිටි බවත් බෝම්බ පිපිරවීමේ ප්‍රයත්නයන් ඇතුලු එහි සියලු ක්‍රියාකාරකම් පිලිබඳව හොඳින් ම දැන සිටි බවත් තහවුරු කරන සාක්ෂ්‍ය දැන් එලිමහනට විත් තිබේ. තව දුරටත් කිව හොත්, ජනාධිපති මහින්ද රාජපක්ෂ සහ රටේ ආරක්ෂක ලේකම්වරයා වන ඔහුගේ සොහොයුරු ගෝඨාභය රාජපක්ෂ ඇතුලු ආන්ඩුවේ

සහ මිලිටරියේ ඉහල පෙළේ නිලධාරීහු ද මෙහෙයුම පිලිබඳව දැන සිටියහ.

තොරතුරු මුලින් ම එළිමහනට පැමිනියේ මාර්තු 18 වන දා සන්ඩේ ලීඩර් පුවත්පතේ "සිංහල කොටි පිටුපස සැඟවුනු හස්තය" යන මැයෙන් පල වූ විමර්ශනාත්මක ලිපියකිනි. "ත්‍රස්තවාදය කුඩු කර දැමීමේ වේශයෙන් මාධ්‍ය සහ වෘත්තීය සමිති අයිතීන් මර්දනය කිරීමට දැරූ මැකියාවෙලියානු ප්‍රයත්නයක කොටසක්" ලෙස හඳුන්වමින් ලිපිය මිලිටරිය විසින් සිද්ධිය යොදා ගත් ආකාරය හෙලා දුටුවේ ය. "ආන්ඩුවේ ඇතැම් දේශපාලනඥයන් ආන්ඩුවේ පිලිවෙතට අනුව යාම ප්‍රතික්ෂේප කරන මාධ්‍ය ආයතන 'මාධ්‍ය කොටින්' ලෙස හැඳින්වීමටත් ඒ අතරේ ඇතැමුන් ඔවුන්ට එරෙහිව කඩා පැනීම සඳහා කැඳවුම් කිරීම දක්වා යාමටත් දැන් ඉක්මන් වන්නේ ය යන කරුන මගින් මෙම තත්ත්වය ප්‍රමානවත් පරිදි ප්‍රදර්ශනය කෙරේ."

සිංහල භාෂාවෙන් පල වන *රාවය* පුවත්පතේ තවත් වාර්තාවක් ප්‍රකාශයට පත් විය. *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* වාර්තාකරුවෝ මේ සම්බන්ධයෙන් තමන්ගේ ම ස්වාධීන පරීක්ෂන සිදු කර ඇති අතර ඒවා මගින් කලින් සඳහන් කල වාර්තා තහවුරු කෙරී ඇත.

## ශර්මාල් ආරක්ෂා කිරීම

පෙබරවාරියේ දී ප්‍රසිද්ධියට පත් කෙරුනු පාපොච්චාරන තුල සඳහන් කෙරනු කේන්ද්‍රීය පුද්ගලයකු වූයේ "ශර්මාල්" නමින් හැඳින්වෙන, ආර්එල්ඕවේ " සන්නද්ධ අංශයේ" නායකයා යැයි නම් කරන ලද පුද්ගලයෙකි. සෙනෙවිරත්නගේ ප්‍රකාශයට අනුව, ශර්මාල් යනු 2004 වසර අග දී සහ 2005 වසර මුල දී එල්ටීටීඊ පාලනය යටතේ පවතින වන්නි ප්‍රදේශයෙහි පිහිටි කිලිනොච්චියට මිලිටරි පුහුනුව ලැබීම සඳහා ගිය කන්ඩායම් දෙකේ ම සාමාජිකයෙක් විය. "එය (මුල් කන්ඩායමේ පුහුනුව) දවස් 7ක් 8ක් විතර පුහුනුවට මුහුන දෙනවා. අපි ආයුධ භාවිතා කරන හැටි සරලව ඉගෙන ගත්තා. තව ව්‍යායාම වගේ දේවල් ඉගෙන ගත්තා. . . . දෙවැනි කන්ඩායමක් හැටියට ඊට මාස ගානකට පස්සෙ ශර්මාල්ගෙ නායකත්වයෙන් තවත් තිදෙනෙක් යනවා." යැයි ඔහු පැවසී ය.

ශර්මාල් ආයුධ භාරව සිටි තැනැත්තා ද වූ බව සෙනෙවිරත්න පැහැදිලි කලේ ය. "(එල්ටීටීඊයෙන්) ගෙනාපු පල වෙනි ආයුධ ටික ශර්මාල් භාරයට තමයි පත් වුනේ. ශර්මාල් ගිහිල්ල ඒ ආපු වාහනෙන් බඩු ටික වෙනම තියා ගෙන පස්සෙ ඒක සිසිර හරහා මාකොල තැනක පත් කලා." යි ඔහු පැවසී ය. ශර්මාල් අඩු ගනනේ අසාර්ථක වූ බෝම්බ පිපිරවීමේ ප්‍රයත්නයන්ගෙන් එකකට වත් වගකිව යුත්තෙකි. " ගෙනාපු බෝම්බවලින් ගනේමුල්ල පාරේ ශර්මාල් මැදිහත් වෙලා ටාගට් එකකට යන්න පුලුවන් කියලා එතන එක ටාගට් එකක් කලා, ඒ වුනාට ඒක මිස් කරනවා."

ශර්මාල් යනු, පාපොච්චාරනවල දී නම් කෙරුනු අනෙක් පුද්ගලයන්ට වෙනස්ව, නිදැල්ලේ හැසිරීමට ඉඩ ලැබී ඇති, මිලිටරියේ ඔත්තුකාර ඒජන්තයෙකු බව පෙන්නුම් කරන බලගතු සාක්ෂ්‍ය දැන් පවතී. කොලඹින් කිලෝමීටර 30ක් පමන දුරින් පිහිටි පහල බියන්වල ගම්වාසීහු පාපොච්චාරන පිලිබඳව තොරතුරු පතල වීමේ ප්‍රතිඵලයක් ලෙස ශර්මාල් යනු අන් කවරෙකු වත් නො ව ප්‍රදේශයේ නිවැසියකු වන 45 වියැති උදය ශර්මාල් කොස්තා බව හඳුනා ගත්හ.

ආන්ඩුවේ ස්වෝත්තමවාදී උද්ඝෝෂනයට ප්‍රතිචාර දක්වමින් ඇතැම් ගම්වැසියෝ ශර්මාල්ගේ පවුලට හිංසා කිරීමට පටන් ගත්හ. ඔහු හෙලා දකිමින් ගම තුල පෝස්ටර ප්‍රදර්ශනය විය. ඔහුගේ නිවසට ගල් ගසන ලදි. "සිංහල කොටියා. ශර්මාල් ද්‍රෝහියා. ඔහු ගමෙන් පන්නනු" යැයි ඔහුගේ නිවස ඉදිරිපිට පිහිටි තාප්පයේ ලියා තිබුනි. ඔහුගේ නිවස ගිනි තැබීමෙන් වලක්වනු පිනිස ප්‍රදේශයේ විහාරස්ථානයේ භික්ෂූන්ට මැදිහත් වීමට සිදු විය.

ශර්මාල් ආරක්ෂා කිරීම පිනිස දරන ලද එක් ප්‍රයත්නයක් ලෙස, කඩවත පොලිස් ස්ථානයේ ස්ථාන භාර නිලධාරි කේ.ආර්.ඒ. ගුනරත්නගේ සහ මිලිටරි රහස් ඔත්තු අංශයේ නිලධාරීන්ගේ ඉල්ලීම පරිදි පෙබරවාරි 19 වන දා ගමේ රැස්වීමක් පැවැත්වුනි. සන්ඩේ ලීඩර් පුවත්පත ඒ පිලිබඳව මෙසේ පැහැදිලි කලේ ය: "රහස් ඔත්තු අංශයේ නිලධාරීන් කඩවත පොලීසියේ ස්ථාන භාර නිලධාරිවරයා සමග එක් වී පුෂ්පාරාම විහාරස්ථානයේ පැවති විශේෂ රැස්වීමකට සහභාගි වීම සඳහා මෑතක දී ශර්මාල් රැගෙන ආවේ ය. නොමග නොයන ලෙසත් ශර්මාල්ගේ දේපල විනාශ කරමින් නීතිය තමන් අතට නො ගන්නා ලෙසත් ඉල්ලා සිටිමින් එහි දී නිලධාරීහු ගම්මුන්ට කරුනු පැහැදිලි කලහ. ශර්මාල් රහස් ඔත්තු අංශයේ සාමාජිකයෙකු බව ඔවුහු අවධාරනය කලහ."

රැස්වීමට සහභාගි වූ සුලු වෙලෙන්දෙකු (ඔහුගේ නම හෙලිදරව් නොකරමු) *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* කියා සිටියේ ශර්මාල් හමුදා රහස් ඔත්තු අංශයට තොරතුරු සපයන්නෙකු වී යැයි නිලධාරීන් කී බව යි. සිවිල් ඇඳුමින් සැරසී සිටි හමුදා රහස් ඔත්තු අංශ නිලධාරියෙකු සහ සන්නද්ධ සොල්දාදුවෙකු සමග ශර්මාල් පැමින සිටි බව රැස්වීමට සහභාගි වූ පුද්ගලයන් කීප දෙනෙක් පැවසූහ. ශර්මාල් මිලිටරි රහස් ඔත්තු අංශයේ වසර තුනක් තිස්සේ වැඩ කරමින් සිටි බව නිලධාරියා කී ය. මේ කියන්නේ ආර්එල්ඕව එල්ටීටීඊයෙන් පුහුනුව හා ආයුධ ලබා ගත්තේ යැයි කියනු ලබන කාල පරිච්ඡේදය ගැන ම ය.

කලින් ගම තුල ශර්මාල් ගැන දැන සිටියේ එල්ටීටීඊ ආධාරකරුවෙකු ලෙස නො ව ඉන්දු-ලංකා ගිවිසුමට එරෙහිව 1988-90 කාල පරිච්ඡේදයේ දී සිංහල අන්තවාදී ජනතා විමුක්ති පෙරමුන ගෙන ගිය දුෂ්ට, ෆැසිස්ට්වාදී උද්ඝෝෂනයට සම්බන්ධ වූ ජවිපෙ සාමාජිකයෙකු ලෙසිනි. ඒ සමයේ දී ජවිපෙ සන්නද්ධ මැරයෝ ඔවුන්ගේ ක්‍රියාකාරකම්වලට සහාය දීම ප්‍රතික්ෂේප කල සිය ගනන් දේශපාලන විරුද්ධවාදීන්, කම්කරුවන් සහ වෘත්තීය සාංගමිකයන් ඝාතනය කලහ. ප්‍රදේශය තුල අතිදරුනු ක්‍රියාකාරකම්වලට සම්බන්ධව සිටි හිටපු ජවිපෙ සාමාජිකයෙකු මිලිටරි රහස් ඔත්තු අංශයට බඳවා ගත්තේ කෙසේ දැයි විහාරස්ථානයේ පැවති රැස්වීම අතරතුර දී පෙර කී සුලු වෙලෙන්දා ප්‍රශ්න කලේ ය.

## ඉහල පෙලේ නිලධාරීන්ගේ අනුමැතිය

ජනාධිපති රාජපක්ෂ විසින් මේ වසර මුල දී තනතුරින් පහ කරන ලද ආන්ඩුවේ හිටපු ජ්‍යෙෂ්ඨ අමාත්‍ය මංගල සමරවීරගේ සම්බන්ධීකරන ලේකම්වරයා වූ ඉරෝෂන් විතානාරච්චි සමග ද ශර්මාල්ට සම්බන්ධකම් පැවතුනි. *සන්ඩේ ලීඩර්* සහ *රාවය* යන පුවත්පත් දෙක ම පසු ගිය මාසයේ දී මේ දෙදෙනා අතර සිදු වූ දුරකථන සංවාදයක පිටපත ප්‍රකාශයට පත් කල අතර ශර්මාල්ගේ ක්‍රියාකාරකම් ගැන ආන්ඩුවේ ඉහල පෙලේ නිලධරයන් දැන සිටි බව ඉන් ඇඟවින. සංවාදයට එම අවස්ථාවේ ශර්මාල් සමග සිටි මිලිටරි නිලධාරියෙක් ද සම්බන්ධ විය.

රහස් ඔත්තු අංශයේ නිලධාරීන් ශර්මාල් ආරක්ෂා කිරීමට පහල බියන්වලට ගිය බව නිලධාරියා ඉරෝෂන් සමග කල කතාබහේ දී පිලිගත්තේ ය. "... අපි පන්සලටට ගිහින් දායකයො හැමෝ ම රැස් කරලා මුලු තත්ත්වය ම පැහැදිලි කරල දුන්නා. හමුදා යුනිෆෝම් ඇඳලා හිටපු අපේ නිලධාරීන් ගිහිං හැම දේ ම පැහැදිලි කලා. ඉන් පස්සෙ කාරනාව එහෙම පිටින් ම අවුල් වුනා." ශර්මාල් අත් අඩංගුවට ගෙන ඇතැයි පුවත්පත් මගින් කියා සිටින්නේ ඇයි දැයි ප්‍රශ්න කරන ලදුව නිලධාරියා මෙසේ කී යː "අපි ඒක නිවැරදි කරලා ලිපියක් හරි නැතිනම් මොකක් හරි දාන්න ගියොත් එහෙම ඊලගට අරහෙන් (එල්ටීටීඊය) කෙලින් ම දන්නවා මේකා තමයි අවුරුදු ගානක් ඇතුලේ ඉඳගෙන කෙලින් ම ඉන්ට් එකේ ඉඳගෙන වැඩේ දුන්නෙ කියලා. ඉතිං ඒක වලක්වා ගන්න තමයි මේ යන විදියට (මාධ්‍යවල) වැඩේ යන්න දීලා තියෙන්නෙ."

ඉරෝෂන්ගේ දේශපාලන සබඳතා පිලිබඳව ප්‍රශ්න කරන ලදුව නිලධාරියා මෙසේ පැහැදිලි කලේ යː " මොන දේශපාලන පක්ෂෙ උනත් කමක් නැහැ. මේ ශර්මාල් සම්බන්ධයෙන් අපේ ආරක්ෂක ලේකම්තුමා, ජනාධිපතිතුමා එතකොට අපේ ඩිෆෙන්ස් මිනිස්ට්‍රියෙ ඉන්න අනිත් හැමෝ ම දන්නවා මේ කතන්දරේ ආ. මොකද ආරක්ෂක ලේකම්තුමා යටතේ තමයි මේ ඔපරේෂන් එක අපි කලේ."

*රාවය* පුවත්පත කියන පරිදි, ප්‍රසිද්ධියේ ජවිපෙන් දුරස්ථව සිටින බවක් පෙන්නුම් කලත් පාර්ලිමේන්තු කන්ඩායමේ නායකයා හා ප්‍රචාරක ලේකම්වරයා වන විමල් වීරවංශ ඇතුලු ජවිපෙ ජ්‍යෙෂ්ඨ නායකයන් සමග ශර්මාල් සමීප සබඳතා පවත්වා ගෙන ගියේ ය. ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ සමග හමුව සංවිධානය කලේ ජවිපෙ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු බව ඉරෝෂන් හා පැවති සංවාදයේ දී ශර්මාල් පැහැදිලි කලේ ය. "රජයෙන් දැන් කෙලින් ම ඉස්සෙල්ල ම සාකච්ඡාවට ගියෙ මචං විමල් එක්ක සාකච්ඡා කරලා තමයි. මචං වීරවංශ හරහා තමයි ගෝට්ව (ගෝඨාභය) සෙට් කලේ."

ආර්එල්ඕව බෝම්බ පිපිරවීම් මාලාවකට ම සම්බන්ධ බවට චෝදනා නැගුනු නිසා කතාව වඩාත් අඳුරු අතකට පෙරලුනි. අත් අඩංගුවට ගත් පුද්ගලයන් තිදෙනාගේ පටිගත කරන ලද පපොච්චාරනවලට අනුව ඒ ප්‍රහාරයන් අතරට මේවා ඇතුලත් වේː එනම්, 2006 ජනවාරි 24 වන දා කොලඹ සහ තදාසන්න ප්‍රදේශවල සිදු කල සුලු පරිමාන බෝම්බ පිපිරවීම් මාලාවක්; 2006 අගෝස්තුවේ දී කිරිබත්ගොඩ සහ පිලියන්දල පිහිටි ඉන්දියානු තෙල් සමාගමට අයත් පිරවුම් හල් අසල සිදු කල බෝම්බ පිපිරවීම්; 2006 සැප්තැම්බර් 10 වන දා ගනේමුල්ල හමුදා කොමාන්ඩෝ බලකා කඳවුර අසල සිදු කල ක්ලේමෝ බෝම්බ පිපිරවීමක්; කිරිදිවෙල දී විදුලිබල ට්‍රාන්ස්ෆෝමරයකට එල්ල කල ප්‍රහාරයක්; සහ 2006 නොවැම්බර් 25 සහ 26 දිනවල දකුනු පලාතේ කොග්ගල නිදහස් වෙලඳ කලාපය අසල පුපුරන ද්‍රව්‍ය ස්ථානගත කිරීම යි.

විරුද්ධ පක්ෂ සමග පෙල ගැසී සිටින *සන්ඩේ ලීඩර්* පුවත්පත 2006 ඔක්තෝබර් 19 වන දා හිටපු අමාත්‍ය ශ්‍රීපති සූරියආරච්චිගේ ජීවිතය බිලි ගැනීමට දැරූ අසාර්ථක ප්‍රයත්නයක් ඉස්මතු කර දැක්වී ය. ඒ සමයේ දී සූරියආරච්චි රාජපක්ෂ ආන්ඩුවේ සාමාජිකයෙකුව සිටි අතර ම, ඔහු සහ මංගල සමරවීර ඒ වන විටත් ජනාධිපතිවරයාගේ පිලිවෙත් පිලිබඳව විවේචනාත්මකව අදහස් පල කොට තිබුනි. බෝම්බය පුපුරා නොගිය නමුත් එම මෙහෙයුම භාරව සිටියේ තමන් බවත්, එහෙත් බෝම්බය පිපිරවීමේ දුරස්ථ පාලකය ක්‍රියා කරවූයේ මිලිටරි රහස් ඔත්තු අංශ නිලධාරීන් බවත් ඉරෝෂන් සමග පැවති සංවාදයේ දී ශර්මාල් පැහැදිලිව කියා සිටියේ ය.

ආර්එල්ඕවේ ක්‍රියාකාරකම් පිලිබඳ බොහෝ ප්‍රශ්න තව මත් නො විසඳී පවතී. ශර්මාල් යනු ආර්එල්ඕව තුල සිටි එක ම හිටපු ජවිපෙ සාමාජිකයා නොවන

අතර එතුල සිටි එක ම මිලිටරි රහස් ඔත්තු ඒජන්තයා ද විය නොහැකි ය. අත් අඩංගුවට ගත් පුද්ගලයන් තිදෙනා වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරයෙකු අප්‍රේල් 5 වන දා උසාවියට කියා සිටියේ තම සේවාදායකයන්ගේ පාපොච්චාරන වධබන්ධන පමුනුවා බලාත්කාරයෙන් ලබා ගත් ඒවා බව යි. පොලිස් පරීක්ෂන තවමත් සිදු වන අතරතුරේ ඔවුහු කිසිදු චෝදනාවකින් තොරව දිගට ම රඳවා ගෙන සිටිනු ලැබේ.

පැහැදිලි කාරනාව වන්නේ වසර තුනක් තිස්සේ මිලිටරිය මෙම කන්ඩායමේ ක්‍රියාකාරකම් පිලිබඳව දැන සිටියා පමනක් නො ව එම ක්‍රියාකාරකම් මෙහෙයවීම ද සිදු කල බව යි. පිලිවෙතක් ලෙස එල්ටීටීඊයට එරෙහිව චෝදනා නැගුනු විවිධාකාර බෝම්බ පිපිරවීම් සියල්ල සම්බන්ධයෙන් ගත් කල, අඩු ගනනේ ඒවා සිදු වන්නට කලින් මිලිටරි රහස් ඔත්තු අංශය ඒ පිලිබඳව දැන සිටි අතර ඇතැම් අවස්ථාවල දී තමන්ගේ ම අරමුනු ඉටු කර ගැනීම පිනිස එය ඒවා දිරි ගැන්වී ය. මෙම නීති විරෝධී සහ ප්‍රකෝපකාරී වූ ක්‍රියාවන්හි දී මිලිටරි රහස් ඔත්තු අංශයේ, සන්නද්ධ හමුදාවල සහ ආන්ඩුවේ සම්බන්ධය ගැන මෙතෙක් කිසිදු නිල පරීක්ෂනයක් ආරම්භ කර නැත.

2006 දී තමන් යලි යුද්ධය කරා පිවිසීම සහ ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත වැනි ප්‍රජාතන්ත්‍ර විරෝධී පියවරයන් පැනවීම යුක්ති සහගත කර ගනු වස් භීතිය සහ වාර්ගික වෛරය අවුස්සනු පිනිස ආන්ඩුව මෙම බෝම්බ පිපිරවීම් ඩැහැ ගත්තේ ය. හිටපු අමාත්‍ය ශ්‍රීපති සූරියආරච්චිට එල්ල කල අසාර්ථක බෝම්බ ප්‍රහාරය වඩාත් නරුම සහගත වන අතර, දේශපාලන ඝාතන ඇතුලු නීති විරෝධී මැර සහ ප්‍රචන්ඩ ක්‍රියාවන්හි දී ආන්ඩුව සහ මිලිටරිය සම්බන්ධ වීමට ඉඩකඩ පවතී ය යන කරුන එමගින් පෙන්නුම් කෙරේ.

මිලිටරිය දිගු කලක් තිස්සේ ආර්එල්ඕව ගැන දැන සිටියේ ය යන කරුන අනුව ගත් කල, කුමන්ත්‍රනය " හෙලිදරව් කිරීමට" ගත් තීරනය රාජ්‍යයේ ඉහල මට්ටමින් ගන්නා ලද දේශපාලන තීන්දුවක් විය. දැන් "හෙලිදරව් කිරීම" මත් හෙලිදරව් වී තිබෙන අතර ආන්ඩුව සහ මිලිටරිය ඉන් සිදු වන දේශපාලනික හානිය අවම කිරීම පිනිස ප්‍රයත්න දරන්නට පටන් ගෙන ඇත. පෙබරවාරියේ දී, විඩියෝ පටිගත කරන ලද පපොච්චාරන විජයග්‍රාහී ලෙස ප්‍රදර්ශනය කල මිලිටරි ප්‍රකාශක බ්‍රිගේඩියර් සමරසිංහ *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* මෙසේ කියා සිටියේ යඃ "අපේ ඒකකවල ඒ විදියෙ (ශර්මාල් බඳු) පුද්ගලයෙක් නැහැ." මාධ්‍යවලට අදහස් නො දක්වන ලෙස පොලීසිය පහල බියන්වල ගම්වාසීන්ට දැන් කියා ඇතිවා පමනක් නො ව, එම පනිවුඩය ශක්තිමත් කරනු පිනිස මාර්තු 21 වන දා අලුයම් කාලයෙහි සිය ගනන් පොලිස් සහ මිලිටරි භටයෝ ගම පීරමින් මෙහෙයුමක් දියත් කලහ.

ආර්එල්ඕව පිලිබඳ මෙකී සමස්ත සංසිද්ධිය වනාහි යුද්ධයට සහ ජීවන තත්ත්වයන් මත එල්ල කරන අඛන්ඩ ප්‍රහාරයන්ට එරෙහිව පල කරන කවරාකාරයේ දේශපාලන විරුද්ධත්වයක් වුව මර්දනය කරනු පිනිස රාජපක්ෂ ආන්ඩුව සහ මිලිටරිය යොදා ගනු ඇති විධික්‍රමයන් සම්බන්ධයෙන් වැඩ කරන ජනතාවට කෙරෙන තියුනු අනතුරු ඇඟවීමකි.